# <u>මහා ආණ්ඩුවට ආපසු පවරා ගැනීම බැරි ඉඩම් හා පොලිස් බලතල ඉල්ලන දෙමළ ජාතික සංධානයේ සුමන්තිරන්ට විවෘත ලිපියක්...</u>

**නොදන්නේ නම් දැන ගැනීම පිණිස** පහත සඳහන් මූලික කරුණු ගෙනහැර දක්වමි.

**රජයේ වාර්තා අනුව,** **2022 මෙරට ජනගහනය - 23187516 - 100%ළ**

| සිංහල | ශ්‍රී ලාංකික දෙමළ | මුස්ලිම් | ඉන්දියානු දෙමළ | අනෙකුත් |
|---|---|---|---|---|
| **74.9%** | 11.2% | 9.2% | 4.2% | 0.5% |
| 17367450 | 2597000 | 2133251 | 973875 | 115900 |

**භාෂාවන් පාවිච්චිය**

සිංහල - 87% - නිල හා ජාතික භාෂාවක් යනුවෙන් හැඳින්වේ.
දෙමළ - 28.5% - නිල හා ජාතික භාෂාවක් යනුවෙන් හැඳින්වේ.
ඉංග්‍රීසි - 23.8 - සංධීය භාෂාවක් යනුවෙන් හැඳින්වේ.

**ආගම්**

| බෞද්ධ | හින්දු | මුස්ලිම් | රෝමානු කතෝලික | අනෙකුත්, |
|---|---|---|---|---|
| 70.2% | 12.6% | 9.7% | 6.1% | 1.3% |

**රටේ පළාත් 09 තුළ ජනගහනය බෙදීයාම**

| | සිංහල | ශ්‍රී ලාංකික දෙමළ | මුස්ලිම් | ඉන්දියානු දෙමළ | අනෙකුත් |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 74.9% | 11.2% | 9.2% | 4.2% | 0.5% |
| පළාත් 09 ජනගහනයෙන් 65%ට වැඩි පළාත් ගණන | **07** | 01 | 0 | 0 | 0 |
| පළාත් ජනගහනයෙන් 10%ට අඩු පළාත් ගණන | 01 | 07 | 07 | 08 | 09 |

**ජනගහනය හා ඉඩම් බෙදීයාම**

| පළාත | රටේ ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස | ඉඩම් ප්‍රමාණය වර්ග කි.මී. | ජනතාවගෙන් 1% කට ඉඩම් ප්‍රමාණය | අනුපාතය |
|---|---|---|---|---|
| **පළාත් 09** | **100%** | **65000** | **650** | 1 |
| උතුරු පළාත | 4.7% | 8882 | 1890 | 2.9 |
| නැගෙනහිර පළාත | 8% | 9780 | 1222 | 1.8 |
| **උතුර+නැගෙනහිර පළාත්** | **12%** | **18662** | **1555** | **2.3** |
| **අනිකුත් පළාත් 07** | **88%** | **46753** | **531** | **0.8** |

මේ අනුව බලන විට උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වන වැසියෙකුට අනෙක් පළාත් 07 හි ජීවත්වන වැසියෙකුට **මෙන් 287.5%** ක ඉඩම් ප්‍රමාණයක් හිමිය. දෙමළ වැසියන් සඳහා එසේ වැඩිපුර ඉඩම් ප්‍රමාණ ඉල්ලීම සාධාරණ ද?

මෙරට මුළු ජනග්‍රහනය සලකා බලන කල ඔබ **දෙමළ ජන වර්ගයට පමණක් විශේෂත්වයක් ඉල්ලීම** සාධාරණ ද? අනිකුත් සිංහල සහ මුස්ලිම් ජනයා සලකා බලන කල **දෙමළ ජන වර්ගයට මෙරට අනිකුත් ජන වර්ග වලට වඩා ඇති ප්‍රශ්න මොනවා ද? අවශ්‍යතා මොනවා ද?** අනිත් ජනයාට වැඩියෙන් විශේෂිත අවශ්‍යතා සපුරා ගත යුතු නම් ඔබ කළ යුත්තේ දෙමළ ජනයාට උතුරු නැගෙනහිර වෙන් කර ගැනීමට වලි කෑම නොව **එම විශේෂිත අවශ්‍යතා ඇති අයත් සමග ඔබගේ මව්බිම වූ දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයට යාමයි**. ඔබ උතුරු නැගෙනහිර පළාත් (මුළු රටින් 28.6% ක බිම් ප්‍රමාණයක් සහ රට වටා ඇති මුළු වෙරළෙන් 1/2 ක් පමණ) දෙමළ වැසියන් සඳහා යැයි කියා ඉල්ලා සිටින්නේ **මෙරට සිටින දෙමළ වැසියන් ගෙන් 30% කට වැඩි ප්‍රමාණයක් උතුරු නැගෙනහිරින් පිට අනිකුත්**

**පළාත් 7 එම පළාත් ජනගහන්යෙන් 85% ක් පමණ වූ සිංහල ජනයා අතර** රැකියා කරමින් ව්‍යාපාර කරමින් ගෙවල් දොරවල් තනා ගනිමින් කිසි විශේෂ ප්‍රශ්න නැතිව ජීවත් වන අවස්ථාවක දී නොවේ ද? උතුරු නැගෙනහිර ආපසු මහාණ්ඩුවට නොදෙන ඉඩම් සහ පොලිස් බලතල ලබා ගැනීම යනු එහි පාලනය ඔබ ඇතුළු ඔබගේ කණ්ඩායම ලබා ගැනීමයි. එසේ වුවහොත් **උතුරු නැගෙනහිරින් පිට දැනට සුහදශීලිව සිංහල අය අතර ගැවසෙමින් සිටින දෙමළ ජනයාගේ තත්ත්වය** ඉදිරියේ දී එතරම් සතුටු දායක නොවිය හැකි බව ඔබට නොතේරේ ද? පසු ගිය විනාශයෙන් ඔබ පාඩමක් ඉගන ගන්නේ නැති ද? ඔබලා සහාය දුන් ප්‍රභාකරන් කැරැල්ල පටන් ගත් අවධියේ සිට මේ දක්වා **උතුරු නැගෙනහිර ද්‍රවිඩ ජනතාවගෙන් සැහෙන කොටසක් සිංහල බහුතරය වෙසෙන ප්‍රදේශ වලට සංක්‍රමණය වී වාසය කරන බව ඔබ දන්නවා ද**? නමුත් ප්‍රභාකරන් කැරැල්ල පටන් ගත් දා සිට උතුරු නැගෙනහිරින් ඔහු හා සගයින් පලවා දැමූ අහිංසක සිංහල සහ මුස්ලිම් බහුතරය දැනටත් අනිත් පළාත් 7 තුළ සමහරු අනාථයන් මෙන් ද අනිත් අය දුප්පත් කමින් පීඩා විඳිමින් ද දුක් සහිත ජීවිතයක් ගත කරන බවත් ඔබ දන්නවා ද? මෙම තත්ත්වය සාධාරණ ද ?

**මීට අවුරුදු 200 කට පෙර 1823 දී කඳුකරයේ එකම දෙමළ වැසියෙක්වත් නොසිටිය ද, 1815 ට පෙර සියලුම ඉඩම් සිංහලයන් සතුව තිබුණ ද,** 1850 න් පසු ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් මුඩු බිම් පනතක් ක්‍රියාත්මක කර **අක්කර 832,498** ක් සිංහලයන්ගෙන් පැහැර ගෙන ඉංග්‍රීසි වැවිලිකරුවන්ට විකුණන ලදී. 1818 සහ 1848 නිදහස් සටන්වලින් අනතුරුව කඳුකරයේ සිංහලයන්ගේ ගෙවල් දොරවල්, ඉඩකඩම් ආදි සියල්ල හැර දමා දිවි ගලවා ගැනීමට කඳුකරයේ ගිරිදුර්ගවලට සහ වෙරළබඩ ප්‍රදේශවල පැන ගිය බව ද, මෙම සටන්වල දී උඩරට නායකයක් ඇතුළු 10,000 කට අධික සිංහලයන් මරණයට පත් වූ බව ද කියැවේ. ඉහත කී අක්කර 800,000 න් බොහොමයක් අද තේ වතු වශයෙන් වගා කර ඇති අතර එම ඉඩම්වල ජීවත් වන්නේ දකුණු ඉන්දියාවේ මලබාර් හා කොරමන්ඩල් ප්‍රදේශවලින් අධිරාජ්‍යවාදීන් ගෙනවිත් පදිංචි කළ වහල් කුලීකරුවන්ගෙන් පැවත එන්නන්ය.

සමානුපාතික ක්‍රමයට බලන විට **උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් අක්කර 900,000 කට වැඩි අයිතියක්** සිංහලයන්ගෙන් ගිලිහී යන අතර **කඳුකරයේ අක්කර 800,000 කට වැඩි ඉඩම් දැනටමත් සිංහල අයිතියෙන් ගිලිහී** ගොස් ඇත. මේ අනුවන්ට **සිංහලයන්ට අහිමි වන බිම් ප්‍රමාණය අක්කර 1,700,000 කට වැඩි වේ.** මේ රට මාතෘ භූමිය කරගෙන අවුරුදු 2500 කට වැඩි කාලයක් ජීවත් වූ සිංහලයාට දරාගත යුතු ද?

ජනවර්ගය දෙමළ වූ පළියට මේ රට ආක්‍රමණය කළ අධිරාජ්‍යවාදීන් ශතවර්ෂ 02 03 කට ඉහත දී දකුණු ඉන්දියාවේ මලබාර් හා කොරමන්ඩල් ප්‍රදේශවලින් වහල් කුලීකරුවන් ලෙස ගෙන ආ ජනතාවගෙන් පැවත එන්නන්ට **මෙරට මාතෘ භූමිය කරගෙන සිටින සිංහලයාටත් වඩා වරප්‍රසාද දිය යුතුද?** ඒවා ඉල්ලා රටේ නැවතත් විරසකයක් ඇති කළ යුතුද? තමාට හෝ තම කල්ලියට උතුරු නැගෙනහිර රජ වීමට මෙරට සිටින විශේෂයෙන් ම අහිංසක දෙමළ ජනතාව පෙලඹවීම අපරාධයක් නොවේද? දේශපාලන පොරපිටියට ඇතුලු වූ නිසා එඬේරුන් ගවයන් දක්කන්නාක් මෙන් උතුරේ පමණක් නොව, අනෙක් පළාත්වල සහ කඳුකරයේ දැනට වාසය කරන අහිංසක දෙමළ ජනතාව මෙන්ම අසාධාරණයට විරුද්ධව නැගී එන සිංහල ජනතාව ද අගාධයට යැවීමට සැලසුම් සකස් කිරීම අපරාධයක් නොවේද?

**නොදන්නේ නම් මෙයත් දැනගන්න.**

ලෝකයේ ජනගහනය කෝටි 8000 ක් පමණ වේ. ජනවර්ග 10000 කට වඩා සිටිති. ඔවුහු කතා කරන භාෂා ගණන 6000 ඉක්මවති. ලෝකයේ සියලු ජාතීන් එකතු වී 1945 දී ඇමරිකාවේ ඇතිකරගත් සංවිධානය **එක්සත් ජාතීන්ගේ සංවිධානය** නමින් හැඳින් වේ. ලෝකයේ **රටවල් ගණන 193** කි. **ජාතියක් යනු ලොව පිළිගත් රටක් අයිති කරගෙන ජීවත් වන ජනවර්ගයකි.** ඒ අනුව වර්තමානයේ ලෝකයේ සිටින්නේ **ජාතීන් 193 ක් පමණි.** සිංහල ජාතිය යනු එම ජාතීන් 193 න් එකකි. **අනෙකුත් සියලුම ජන කණ්ඩායම් ජනවර්ග ලෙස හැඳින්වේ.** 10,000 කට කිට්ටු එවැනි ජනවර්ගවලට කිසිදු රටක ප්‍රධාන අයිතියක් නොමැත. **තමන්ට කියා රටක් නොමැතිව ලෝකයේ සෑම රටකම පාහේ ජීවත් වන විශාලතම ජනවර්ගය ඔබ අයිති දකුණු ඉන්දියානු දෙමළ ජනවර්ගයයි.** දෙමළ ජනවර්ගයට තමාටම කියා රටක් නැති බැවින් **දෙමළ යනු ජාතියක් නොවේ.** ජනවර්ගයක් පමණි. දෙමළ භාෂාව දැනට වසර 50ට පෙර ලෝක භාෂාවක් වශයෙන් නොතිබිණි. එය ලෝක භාෂාවක් වූයේ ජේ.ආර්. ජයවර්ධන නැමැති වසර 350 ට පමණ පෙර තමිල්නාඩුවේ කොරමැන්ඩල් ප්‍රදේශයෙන් පැමිණි දෙමළ වැසියකු ගෙන් පැවත එනවා යැයි කියන මෙරට පළමු විධායක ජනපති දෙමළ භාෂාවටත් සිංහල භාෂාවේ තැන - රටේ ජාතික භාෂාවක් හැටියට ලබා දුන් බැවිනි. එම තීරණය සාධාරණ යැයි කිව නොහැක. එවැනි **විශේෂ තැනක් දෙමළ භාෂාවට ඉන්දියාව ඇතුළු කිසිම රටකින් ලැබී නොමැත**. එසේ සැලකූ රටෙන් අසාධාරණ විදිහට කොටසක් වෙන් කර ගැනීමට ඔබ දරණ ප්‍රයත්නය ඉතාමත් අසාධාරණ නොවේ ද?

ඇමරිකා එක්සත් ජනපදයේ වසර 2000 වන තෙක් ජාතික භාෂා 3ක් තිබිණි. 2000 දී ජනාධිපති තනතුරට පත් වූ බිල් ක්ලින්ටන් ජනපතිවරයා එම රට පොහොසත් වුවත් ජාතික භාෂා වශයෙන් භාෂා 3ක් තිබෙන විට ඒ සඳහා අනවශ්‍ය අමතර කෝටි දහස් ගණනක වියදමක් රජයට දැරීමට සිදු වන බවත් ස්පාඤ්ඤ භාෂාව ස්පාඤ්ඤයේ තිබෙන බැවින් ද, ප්‍රංශයේ භාෂාව ප්‍රංශයේ තිබෙන බැවින් ද, ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික භාෂාව හැටියට ඉංග්‍රිසි නම් කරන ලදී. එකල ජනග්‍රහනයේ 10%ටත් වඩා ඉංග්‍රීසි බස නොදන්නා අය එම රටේ සිටියද ඒ අයට ඉංග්‍රීසි භාෂාව

ඉගනගැනීමට පහසුකම් සලස්වා, ගත් තීරණය ක්‍රියාත්මක කරන ලදී. එම තීරණය සලකා බැලීමේ දී මෙරටද කළ යුතුව තිබුණේ සම්පූර්ණ රටේ සිංහල භාෂාව පමණක් ජාතික භාෂාව හැටියට ප්‍රකාශ කර දෙමළ වැසියන්ට සිංහල ඉගනීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි. ප්‍රංශයේ ප්‍රංශ බස සහ ස්පාඤ්ඤයේ ස්පාඤ්ඤ බස විදිහටම තමිල්නාඩුවේ දී දෙමළ බස දිගටම පාවිච්චි වන බැවිනි.

ජේ.ආර්. ජයවර්ධන හිටපු විධායක ජනපති ගත් වැරදි තීරණ නිසා මෙරට පළාත් 8 කම කෝටි 1 ත් වැඩි සිංහල දරුවන් සහ දෙමාපියන් තම කාලය ශ්‍රමය හා ධනය කැප කරන්නේ ජාත්‍යන්තරව පාවිච්චි වන භාෂාවක් නොව ඉන්දියාවේ ප්‍රාන්ත 29 න් 1 ක පමණක් පාවිච්චි වන ප්‍රාන්ත භාෂාවක් වන දෙමළ ඉගනීම සඳහා යි. කෝටි ගණන් වියදම් කරමින් මෙරට රජය දැන් කරන්නේ ඔබ වැනි අයගේ ඉල්ලීම් වල අසාධාරණත්වය ගැන දැනුමක් නැති බටහිර රටවල සහ ඉන්දියානු බලපෑම් මත බව පැහැදිලිව දැකිය හැක. මෙම අනවශ්‍ය වැරදි තීරණය නොගත්තේ නම් අද දිනය වන විට මෙරට **රුපියල් බිලියන 1000ට** වැඩියෙන් ඉතුරු කර ගැනීමට හැකි වන බව නොවනු මානයි.

**සිංහල දරුවන් දෙමළ බස ඉගනීම නිසා ජාතික හෝ ජාත්‍යන්තරව කිසිම විශේෂ දියුණු වීමේ අවස්ථාවක් මම නම් නොදකිමි. දෙමළ ඉගනගෙන තමිල්නාඩුවේ රැකියා කිරීමට එහි යාමට මෙරට කී දෙනෙක් සූදානම් දැයි නොදනිමි**. මට පෙනී යන්නේ ජනගහනයේ 75% ක දරුකැලක් අති විශාල මුදල් සම්භාරයක් හා වටිනා කාලය කැප කර දෙමළ ඉගන ගන්නේ 15% ක් පමණ වන මෙරට සිටින දෙමළ වැසියන් සමග අදහස් හුවමාරු කර ගැනීමට ද? මෙරට සිටින 15% ක් පමණ වන දෙමළ ජනයා තම දරුවන්ට සිංහල ඉගන ගැනීම සඳහා (වසර 2000 දී ඇමරිකාවේ ස්පාඤ්ඤ හා ප්‍රංශ දරුවන්ට ඉංග්‍රිසි ඉගනීමට සැලැස්සුවා මෙන්) පහසුකම් සැපයුයේ නම් මේ භාෂා ප්‍රශ්නය ටිකෙන් ටික සමනය වනවා නොඅනුමානයි. දෙමළ දෙමාපියන්ට තම දරුවන්ට විශේෂයෙන්ම දෙමලෙන් උගන්වා තමිල්නාඩුවට යැවීමට අවශ්‍ය නම් ඔවුන්ගේ දරුවන්, දැනට චීනයට, රුසියාවට, යුරෝපයට, ඇමරිකාවට ඒ ඒ බසින් ඉගනීමට යවන්නා වූ මෙරට  දරුවන් මෙන්, කිසිම ප්‍රශ්නයකින් තොරව යැවිය හැක. එයට කිසිම බාධාවක් නොමැත. සිංහල දරුවන්ට දෙමළ බස පසෙකටලා එම කාලය ඉංග්‍රිසි, චීන, රුසියානු, ප්‍රංශ, ජපන් ආදි භාෂාවන් ඉගනීමට මග පාදා ගත්තොත් හොඳින් වැටුප් ලැබෙන ජාත්‍යන්තර රැකියා ලබා ගැනීමට ඔවුන්ට හැකි වනු ඇත. එවිට මෙරටටත් එමගින් වැඩි වැඩියෙන් විදේශ විනිමය උපයා ගත හැක වනු ඇත. මෙම කරුණ තේරුම් ගැනීමට ඔබට හැකි යැයි සිතමි. දැනට කුමන කරුණු නිසා හෝ රජය ගත් වැරදි තීරණ ඇත්නම් ඒවා අනාගත පරපුර වෙනුවෙන් ඉදිරියේ දී නිවැරදි කර ගත යුතුව ඇත.

ලෝකයේ රටවල් ගැන කතා කිරීමේ දී ප්‍රධානම වචන දෙකක් භාවිත වේ. එනම් ජන්ම භූමිය හා මාතෘ භූමියයි. **ජන්ම භූමිය** යනු යමෙක් උපන් භූමිය හෝ දේශයයි. එයට ජාති ආගම් ආදි කිසිම භේදයක් නොමැත. ඕනෑම ජනවර්ගයක, ඕනෑම පවුලක මෙම රටවල් 193 න් එකක දරුවකු ඉපදුණහොත් එම දරුවාගේ ජන්ම භූමිය ඔහු හෝ ඇය ඉපදුණු රටයි. උදාහරණයක් වශයෙන් ගත් කළ එංගලන්තයේ ජීවත් වන සිංහල පවුලකට දරුවකු ඉපදුණහොත් එම දරුවාගේ ජන්ම භූමිය එංගලන්තයයි. එසේම ඉංග්‍රීසි පවුලකට මෙරටදී දරුවකු ඉපදුණහොත් එම දරුවාගේ ජන්ම භූමිය මෙම රටයි.

**මාතෘ භූමිය** හෙවත් **මව්බිම** යනු ජන්ම භූමියට වඩා ගැඹුරු අර්ථයක් ඇති වචනයකි. කෙටියෙන් අර්ථ දැක්වුවොත් එය **''මුතුන්මිත්තන්ගේ දේශය''** යනුවෙන් හැඳින්වේ. ජාත්‍යන්තර විශ්වකෝෂය මාතෘ භූමිය හඳුන්වා දී ඇත්තේ (**Land of Ancesstors** ) යනුවෙනි. මාතෘ භූමිය හෝ මව්බිම යනු එම ජාතියේ මුතුන්මිත්තන් විසින් අවුරුදු දහස් ගණනක් තිස්සේ දියුණු කර ඔවුන්ටම ආවේණික භාෂාවක්, සංස්කෘතියක් හා සභ්‍යත්වයක් ඇති කර ප්‍රධාන ආගමකට නැඹුරු වී ඉතිහාසය පුරා දහස් ගණනින් නොව ලක්ෂ ගණනින් ජීවිත පූජා කර ආක්‍රමණිකයන්ගෙන් හා කැරලිකරුවන්ගෙන් රැකගෙන තම වර්තමාන පරපුරට උරුම කර දුන් දේශයයි. මව්බිම් හැටියට ලෝකයේ එවැනි රටවල් ඇත්තේ ඉහත සඳහන් කළ **රටවල් 193 අයිතිකර ගෙන ජීවත්වන ජාතීන්ට පමණි.** එම 193 න් එකක් වන මේ රට සිංහල ජාතියේ වත්මන් පරපුරට ඔවුන්ගේ මුතුන්මිත්තන් හිමිකර දුන් දේශයයි. එම **දේශය සම්පූර්ණයෙන්ම සිංහල මව්බිමයි. වෙන කිසිම රටක් අපට අයිති නැත. එම ඉතිරි ජාතීන් 192 න් එකකට හෝ ජනවර්ග වශයෙන් ජීවත් වන 10,000 කට කිට්ටු ජනවර්ගවලට මේ රට අයිති නැත. මේ අනුව <u>කිසිම ලෙසකින් මේ රට දෙමළ, මුස්ලිම් ජනවර්ගවලට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ ප්‍රදේශ වශයෙන් අයිති නැත.</u>**

මෙයින් පෙන්වා දීමට උත්සාහ කරන්නේ ලංකාවේ සිංහලයන් පමණක් ජීවත්විය යුතු බව නොවේ. නමුත් මේ රට මෙහි වෙසෙන **සිංහල, දෙමළ, මුස්ලිම්, ජා, බර්ගර් ආදි වෙනත් ජනවර්ගවල ජන්ම භූමිය** වුවත් **සිංහල ජාතියේ මව් බිම බවයි.** මේ රට මෙන්ම ලෝකයේ ඇති අනෙක් රටවල් 192 කම **බහු ජාතික, බහු ආගමික** රටවල් වේ. **ප්‍රධාන ජාතියේ මූලික වගකීම නම් සුළු ජනවර්ග ආරක්ෂා කර සහෝදරත්වයෙන් ජීවත් වන අතර සුළු ජනවර්ගවල අන්තවාදී ඉල්ලීම්වලට ඉඩ නොදී රට ස්ථාවරව පැවත්වා ගැනීමයි.**

රටක් මාතෘ භූමිය ලෙස අතීතයේ පටන් බොහෝ කාලයක් තිස්සේ ගොඩනගා දියුණු කර ආරක්ෂා කර අයිතිකර ගෙන ඇති ජාතියකට එම රටේ හිමිවන **ප්‍රධාන අයිතීන්ගෙන් සමහරක්** පහත දැක්වේ.

- රටේ පූර්ණ ඉඩම් අයිතිය
- එම ජාතියේ ඕනෑම අයෙකුට රටේ ඕනෑම තැනකට යාමට ඒමට ඇති අයිතිය
- රටේ ඕනෑම තැනක රැකියාව කිරීමේ අයිතිය
- රටේ භාෂාවට ඇති අයිතිය
- රටේ නීතියට ඇති අයිතිය
- රටේ ඉතිහාසයට ඇති අයිතිය
- රටේ සංස්කෘතියට ඇති අයිතිය
- ජාතියේ ප්‍රධාන ආගමකට ප්‍රමුඛත්වය දීමේ අයිතිය
- රටේ ප්‍රධාන ජාතික තීරණ ගැනීමට ඇති අයිතිය

**මේ රටේ ඉහත සඳහන් අයිතීන් හිමි විය යුත්තේ සිංහල ජාතියටයි.** දෙමළ, මුස්ලිම් ආදි ජනවර්ගවලට තම **වර්ගවාදී අයිතීන් ගැන තීරණ ගැනීමට මෙම සිංහල මව්බිමේ දී අයිතියක් නොමැත.** සුළු ජනවර්ග **ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් ලබා ගැනීමට අවශ්‍ය නම් ඔවුන් තම මව්බිම් වන බහුතරය ජීවත්වන රටවලට යා යුතුය.** ලෝකයේ අනෙක් **සෑම රටකම ජීවත්වන සුළු ජනවර්ගවල ප්‍රජාතාන්ත්‍රික අයිතීන්වලට වඩා අයිතීන් මෙරට සුළු ජනවර්ගවලට දැනටමත් ලබා දී ඇති** බව සංසන්දනය කිරීමෙන් මනාව පැහැදිළි වේ.

16 වන සියවසේදී කෝට්ටේ ධර්මපරාක්‍රමබාහු රජු සමග **පෘතුගීසින් යාපනය ප්‍රදේශය සඳහා ඇතිකරගත් ගිවිසුම ලියා ඇත්තේ පෘතුගීසි සහ සිංහල භාෂාවෙන් පමණකි, 1815 උඩරට ගිවිසුම ලියා ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් පමණක්** වීමත්, තවද රට හඳුන්වා දී ඇත්තේ **''සිංහලේ රාජ්‍යය''** සහ **සිංහලේ වැසියන්** වීමත්, **මෙරට ජාතික වශයෙන් ''සිංහලේ''ලෙස හැඳින්වූ** බවට තදබල සාක්ෂි නොවේද? අවුරුදු දහස් ගණනක් පැරණි රටේ අනෙකුත් පළාත්වල මෙන්ම උතුරු නැගෙනහිර පළාත්වලත් **අවුරුදු දහස් ගණනක් පැරණි සිංහල ශිෂ්ටාචාරය** හා බැඳුණු **ඉපැරණි වැව් සහිත වාරිපද්ධතිවලින්** ද, **නමින් හඳුනාගත් බෞද්ධ සිද්ධස්ථාන 264** ක් සහ තවත් **හඳුනා නොගත් පැරණි බෞද්ධ සිද්ධස්ථාන සියගණනකින්** සහ තැන් තැන්වල ජීවත්වන පරම්පරාගත සිංහල ජනයා සහිත ගම්මානවලින් ඔප්පු වන්නේ මෙම ප්‍රදේශය අතීතයේ සිටම සිංහලයාට අයිතිව තිබූ බව මිස වෙන කුමක්ද?

**ක්‍රි.ව. 125** ක ඈත අතීතයේ දී සද්ධාතිස්ස රජු විසින් කරන **පදවි වැව** ක්‍රි.ව. **650 දී** 1 වැනි අග්බෝ රජු විසින් කරවන ලද **මුලතිව්** නගරයට නිරිත දෙසින් පිහිටා ඇති **කුරුඳු වැව** දැනට තන්නි මුරුක්කුකුලම් වැව හා එම වැව් ඉස්මත්තේ ඇති කුරුඳු විහාරයේ නටබුන්, **මන්නාරමේ අකච්චිමුරුක්කු වැව**, **යාපනේ ඉරණමඩුකුලම් වැව**, **වවුනියාවේ පාවට්කුලම් වැව, වන්නිකුලම් වැව, ක්‍රි.ව. 822** දී අග්බෝ රජු කරනව ලද **කන්තලේ වැව,** ධාතුසේන රජු **(459-469)** විසින් කරවන ලද **හරන්කාව වැව**, අක්කර 14000 ක් අස්වැද්දිය හැකියයි සැලකෙන **යෝධ වැව** ආදී **ප්‍රධාන වැව් සහ කුඩා වැව් සමූහය සහිත සංකීර්ණ වාරික්‍රම පද්ධතිය යාපනය, මන්නාරම, මුලතිව්, පදවිය, කන්තලේ ආදි සියලු ප්‍රදේශවල පෙර සිටම පැවති සිංහල අයිතිය මනාව විදහා පායි.**

මීට අමතරව 1936 දී **යාපනේ** විශ්ණු කෝවිල් කැනීමක දී හමුවූ **වසභ රජුගේ (ක්‍රි.ව. 66-118) වල්ලිපුරම් රන්පතට** අනුව එම රජුගේ **ඉසගිරි ඇමති** විසින් **නාගදීපය** පාලනය කළ බව පැහැදිලිව දක්වා ඇත.

**ඔක්ස්ෆර්ඩ් සරසවියේ සී.සී. ඩේවිස් මහාචාර්යවරයාගේ පැරණි සිතියම්වල** පවා දක්වා ඇත්තේ **ක්‍රි.පූ. 5 වන සියවසේ සිට ක්‍රි.ව. 1500 දක්වා** මෙරට **''සිංහලේ''** යනුවේනි මෙරටින් **සියමට** රැගෙන ගිය බෞද්ධ උපසම්පදාව **''සිංහල උපසම්පදාව''** යනුවෙන් හඳුන්වා ඇති අතර, **ඉන්දියාවේ** සමුද්‍රගුප්ත රජුගේ (325-350) **අලහබාද් ප්‍රශක්තියේද සිංහල දීප** හැටියටත්, **බුරුමයේකල්‍යාණි ශිලා ලිපියේ** (1459) මෙරට ''සිංහලේ''හැටියටි දක්වා ඇත. ඒ අනුව **ජාත්‍යන්තර වශයෙනුත් මෙරට ''සිංහලේ'' හැටියට අවිවාදයෙන් පිළිගෙන ඇත.**

ජාතික වශයෙන් ගත්කළ 1815 ඉංග්‍රීසින් සමග අත්සන් කළ **උඩරට ගිවිසුමේද** මේ රට හඳුන්වා ඇත්තේ සිංහලේ නමිනි. අතින් ලියන ලද **පිටු 14** කින් සමන්විත එම ගිවිසුමේ සෑම පිටකම වෙන් වෙන් වශයෙන් **වම් පැත්තේ භාගය ඉංග්‍රීසීන්ට තේරුම්ගත හැකි වන පරිදි ඉංග්‍රීසියෙන්** ද දකුණු පැත්තේ භාගය **සිංහලයින් තේරුම්ගත හැකි පරිදි සිංහලයෙන්** ද දක්වා ඇත. මෙයින් **පෙනී යන්නේ 1815 දක්වාම මේ රටෙ ජාතික වශයෙන් සිංහල ජනතාවගේ මව්බිම වන සිංහලේ ලෙස පිළිගෙන ඇති බවයි.** **<u>මෙහි දෙමළ අයිතියක් ගැන කෙසේවත් සඳහන් වී නොමැති බව ඔබ ඇතුලු සියල්ලන්ම දැනගත යුතුව ඇත.</u>**

**මලේ මලේ තැඹිලිය වැන්න පොල් මලේ - රළේ රළේ මුහුදින් දමන දිය රළේ**

**බලේ බලේ රාසිං දෙයියංගෙ බලේ - ගලේ කොටුව බැන්දයි තිරිකුණා මලේ**

සිංහල පොඩි ළමයෙකු පවා දන්නා දෙවැනි රාජසිංහ රජු (ක්‍රි.ව. 1634-1186) වෙනුවෙන් ලිය වූ කවි පන්තියෙන් කියැවෙන්නේ සිංහලයන් ත්‍රිකුණාමලය රැකගත් ආකාරයයි. දිවි පුදා එසේ රැකගත් **ෆාහියන් සහ භද්‍ර කච්චායනා බිසව මෙරටට සැපත් වූ ආසියාවේ හොඳම ස්වභාවික වරාය වන ත්‍රිකුණාමලය** ඔබ සිංහලයන්ට කියන්නේ බන්දේසියක තබා දෙමළ වැසියන්ට තෑගී දීමටද? දෙවැනි ලෝක යුද්ධයේ දී ලෝකයේ හොඳම ස්වභාවික වරාය වන සැන් ෆ්‍රැන්සිස්කෝ හි පිහිටි **පර්ල් වරායට ජපනුන්ගේ බෝම්බ දැමීම**ත් සමග අමෙරිකාව ඊට **පිළිතුරු** දුන්නේ ප්‍රථම වතාවට **න්‍යෂ්ටික බෝම්බ පුපුරුවා ජපානයේ දී ලක්ෂ ගණනක් තත්පර කීපයක් තුළ වාෂ්ප කිරීමෙනි.** එබැවින් ඔබ මෙරටින් මෙවැනි වටිනාම ප්‍රදේශයක් ලබා ගැනීමට කරන උත්සාහය සාධාරණද?

ඔබ මේ ගැන සිතන්නේ කුමක්ද?

**දෙමළ මව්බිම** වශයෙන් ජාත්‍යන්තරව පිළිගෙන ඇත්තේ **තමිල්නාඩුව** නමැති දකුණු ඉන්දියාවේ පිහිටි, ඉන්දියාවේ **ප්‍රාන්ත 29 න් 1** ක් පමණි. ලෝක දෙමළ ජනගහනයෙන් 75% ක් පමණ එහි ජීවත් වෙති. **මෙරට ජීවත් වන්නේ ලෝක දෙමළ ජනගහනයෙන් 4% කටත් වඩා අඩු ප්‍රමාණයකි.** මෙරට **උතුරු නැගෙහිර** පළාත්වල ජීවත් වන්නේ **ලෝක දෙමළ ජනගහනයේ 2% ටත් වඩා අඩු** ප්‍රමාණයකි. මේ අනුව බලන කල මානසික රෝගීන් නොවන විවෘත මනසකින් යුතු ඕනෑම අයෙකුට **මෙරට උතුර නැගෙනහිර පළාත්වල දෙමළ මව්බිමක් නොමැති බව** හොඳින් පෙනි යා යුතුයි.

ඉතිහාස මූලාශ්‍රවලට අනුව **ලන්දේසීන්** විසින් දැනට වසර 350 කට පමණ පෙර **දුම්කොළ වැවීම සඳහා** දෙමළ වහල් කුලීකරුවන් දකුණු ඉන්දියෙන් ගෙන්වා ගත් බව ද ඉන්පසු වසර 150 කට පමණ පෙර **බ්‍රිතාන්‍යයන්** විසින් **කෝපි වැවීම සඳහා හා තේ වැවීම** සඳහා ඉන්දියාවෙන් තව තවත් දෙමළ කුලීකරුවන් ගෙන්වා ගත් බවත්, මෙම ජනයාගෙන් 50% ක් පමණ සිරිමා - ශාස්ත්‍රි ගිවිසුම යටතේ ඉන්දියාවට පිටත්කර හැරි බව ද කියැවේ.

අවුරුදු දහස් ගණනක් තිස්සේ අතීතයේ සිට ඒකීය රටක්ව පැවැති දේශයකින් කොටසක් කඩා වෙන්කර තම ජන වර්ගයට වෙනම අලුතින් රටක් වෙන්කර ගැනීමට කරන උත්සාහය භයානක විපත් ගෙනදී ඇත. අවුරුදු දහස් ගණනක් තිස්සේ ආක්‍රමණවලට, කැරළිවලට මුහුණපා ලක්ෂ ගණනින් මියඇදී රට බේරාගෙන වත්මන් පරපුරට හිමිකළ සිංහල වැනි ජාතියක් එවැන්නකට කිසි ලෙසකින්වත් අවස්ථාවක් නොදෙනු ඇත. ජාති ද්‍රෝහී, දේශ ද්‍රෝහී, අතිආත්මාර්ථකාමී,සිංහල බෞද්ධ සළු පොරවාගත් අසිංහල අබෞද්ධ පරගැති පාලකයින් කීපදෙනෙකු නිසා මෑත කාලයේ මෙරට ගමන් මග තරමක් වෙනස් වූවත් අනිවාර්යයෙන් ජාති හිතෛෂී, දේශ හිතෛෂී පරම්පරාගත සිංහල බෞද්ධ නායකයන් යටතේ, **අතීතයේදී එවැනි තත්ව වෙනස් වී ඇත. ඉදිරියටත් එසේම වනු ඇත.**

ක්‍රි,පූ. 237 දී සේන හා ගුත්තික යන දෙමළ ආක්‍රමණිකයන්ගෙන් පටන් ගෙන ප්‍රභාකරන් දක්වා අවුරුදු 2300 ක් ඇතුළත් දෙමළ වාර්ගිකයන්ගේ තාඩන පීඩනවලට සිංහලයා සාර්ථකව මුහුණ දී ඇත. **සියලුම ජනයාට හා සතුන්ටත් මෛත්‍රී කරන ලෙස අවවාද අනුශාසනා කළ මහඟු දර්ශනයක් වන බෞද්ධ දර්ශනයෙන් බහුතර සිංහලයාගෙන් 90% කට වැඩි පිරිසක් හසුරුවන** බැවින් එය දුර්වලකමක් ලෙස සැලකීමට සුළු ජාතීන්ගෙන් සුළු කොටසක් වන අන්තවාදීන්ගේ සිරිතක් වී ඇත. නමුත් එය එසේ නොවන බව ඔවුනට 2005-2009 අතර ඔවුනගේ අත්දැකීමෙන් හෝ තේරුම් ගත යුතුව ඇත. **ප්‍රජාතන්ත්‍රවාදය යනු මංකොල්ලකරුවන්ගේ / ත්‍රස්තවාදීන්ගේ මූලික අයතීන් තහවුරු කර සාමාන්‍ය ජනතාවගේ මානුෂික අයිතීන් අහිමි කිරීම නොවන බව කාරුණාවෙන් සලකන්න.**

මෙරට වර්තමාන නායකයින් රටේ ජාතීන් අතර සංහිඳියාවක් හා යහජීවනයක් ගැන කතා කරතත්, **අවුරුදු 2500 කට වැඩි කාලයක සිට 1977 වනතුරු මේ රටේ ජීවත් වූයේ සිංහල ජාතිය පමණි. සිංහල ජාතිය දෙමළ සහ මුස්ලිම් ජන වර්ග අවුරුදු දහස් ගණනක ඉතිහාසය පුරා වෙනම ජාතියක් සහ වෙනස් ජන වර්ග වශයෙන් ජීවත් වූවෝ වෙති.**

ඉහත ගෙනහැර දක්වූ කරුණ සහ තවමත් ගෙනහැර නොදක්වූ ඔබ සහ රටේ ජනයා දැනගත යුතු විශේෂිත කරුණු ගැන සැලකීමේ දී පසුගිය කාලයේ රට අගාධයට ඇදීමට සහ දස දහස් ගණනින් සිංහල, දෙමළ, මුස්ලිම් වැසියන් මරණයට පත්වීම සම්බන්ධයෙන් කොටි සංවිධානය හා බැඳී තිබුණු දෙමළ ජාතික සංවිධානය අසාධාරණ, අත්තනෝමතික, රට බෙදීම හා තමන්ට විශේෂිත බලතල නිතර ඉල්ලා සිටින්නේ වර්තමානයේ රට කරවන ජනපති හා අගමැති දෙපළ ද ගොලු බිහිරි මානසික රෝගී තත්ත්වයක් ඇති අය යැයි සිතාගෙන දැයි නොදනිමි.

**2016 මැයි මස 27 වනි සිකුරාදා දිවයින** පුවත්පතේ **ශ්‍රී ලංකා ඉතිහාසය නැවත ලිවිය යුතු බව ද, ජනාධිපති පත් කළ යුත්තේ ඉන්දීය ව්‍යවස්ථාවේ 54 - 55 වගන්ති බව ද, වරායන් සහ දේශීය ගුවන්තොටුපලවල් පාලනය සඳහා ව්‍යවස්ථාදායක බලතල අවශ්‍ය බවද, උතුරු නැගෙනහිරින් මුළු හමුදාවම ද ඉවත් කළ යුතු බවද, උඩරට කඳුකරය සඳහා ද්‍රවිඩ කවුන්සිලයක් පත් කර සියළු බලතල ලබා දිය යුතු බවද ඇතුළත් උමතු යෝජනාවක් උතුරු පළාත් සභාවෙන් ඉදිරිපත් කර ඇති බව වාර්තා වී තිබුණි**. උතුරේ දේශපාලඥයන් මේ දේවල් කියන්නේ සිහියෙන් ද අසිහියෙන් දැයි මට නම් නොතේරේ. මෙවැනි මෝඩ මනස්ගාත වලට පිළිතුරු දීමට අපට ඇති රුදාවක් නැත.

රටට හා සාමාන්‍ය සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට අවශ්‍ය වන්නේ රැකියා ව්‍යාපාර කරගෙන දරුවන්ට අධ්‍යාපනය ලබා දෙමින් හොඳින් සාමකාමීව, ප්‍රජාතන්ත්‍රවාදීව තම තමන්ගේ ජීවිත ඉදිරියට ගෙනයාමයි. ඉන්දියාවෙන්

50 න් පංගුවක් පමණ වන අවුරුදු 2500 ක් පැරණි මේ රට බෙදීමට වලිකනවා නම්, 2009 ට පෙර පැවති තත්ත්වයට පත්වීම වැළැක්විය නොහැක.

දෙමළ ජාතිකයන්ට මැති ඇමති, පොලිස්පති, නීතිපති, අගවිනිසුරු, මහබැංකු අධිපති වැනි රටේ උසස්ම තනතුරු ලබා ගැනීම කිසිම බාධාවක් නොමැත. එම තනතුරු දෙමළ වාර්ගිකයින් හොබවනවා ඔබ අප සියලු දෙනා දැක ඇත. මෙරට දෙමළ පක්ෂ නායකයකුට **අගමැති, ජනපති තනතුරටක්** හෙබවීමට අවශ්‍ය නම්, කළ යුත්තේ ඉන්දියාවට ගොස් **හැකිනම් තමිල්නාඩු ප්‍රාන්තය වෙනම රාජ්‍යයක් ලෙස ඉන්දියාවෙන් කරවාගෙන** එහි ජනපති, අගමැති තනතුර දැරීමයි. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් කිසි ලෙසකින්වත් ඔබ වැනි ද්‍රවිඩයින්ට සීමා කිරීමට නොහැකිය. අවුරුදු 2500 කට වැඩි සිංහල ඉතිහාසයේ තම මව්බිමේ ඕනෑම තැනකට යාමට ඒමට, ජීවත් වීමට, රැකියා කිරීමට සිංහලයන්ට මෙන්ම සුළු ජනවර්ගවලට තිබූ නිදහස ඉන්දියාවේ හා බටහිරයන්ගේ මතයට වහල් වී කැප කිරීමට කිසිම ප්‍රජාතන්ත්‍රවාදී, සාමකාමී, දේශහිතෛෂී රජයක් පියවර නොගනු ඇත.

ජපානය ජපනුන්ගේ රට නම්, චීනය චීන්නුන්ගේ රට නම්, ජර්මනිය ජර්මානුවන්ගේ රට නම්, මෙසේ **ජාතිකව සහ ජාත්‍යන්තරව ''සිංහලේ'' හැටියට පිළිගෙන තිබූ දේශය,** සිංහලයන්ගේ නොවන බව කිව හැකිද? එසේ කියන්නන් නරුමයන්, මානසික රෝගීන් හෝ උන්මත්තකයන් හැටියට හැඳින්විය නොහැකිද?

<u>**2013 පෙබරවාරි මස දේශ හිතෛෂී ජාති හිතෛෂී නායකයෙකු හැටියට ප්‍රසිද්ධියට පත් රුසියානු ජනාධිපති ව්ලැද්මියර් පුටින් - lower house of Russia's Federal Assembly හිදී කළ දේශනයක කොටසක් පහත දැක්වේ.**</u>

"In Russia live Russians. Any minority, from anywhere, if it **wants to live in Russia, to work and eat in Russia**, should speak Russian, and should **respect the Russian laws**. If they prefer Sharia Law, and live the life of Muslims then we advise them to go to those places where that's the state law. **Russia does not need Muslim minorities. Minorities need Russia, and we will not grant them special privileges, or try to change our laws to fit their desires, no matter how loud they yell 'discrimination'.** We will not tolerate disrespect of our Russian culture. We had better learn from the suicides of America, England, Holland and France, if we are to survive as a nation. The Muslims are taking over those countries and they will not take over Russia. The Russian customs and traditions are not compatible with the lack of culture or the primitive ways of Sharia Law and Muslims. When this honorable legislative body thinks of **creating new laws,** it should have in mind **the Russian national interest first**, observing that the **Muslim minorities are not Russians**. The politicians in the Duma gave Putin a five minute standing ovation.

මීට අමතරව,

<u>**ඕස්ට්‍රේලියානු අගමැති ජෝන් හාවර්ඩ් ගේ දේශනයකින් කොටසක් පහත දැක්වේ.**</u>

**Muslims who want to live under Islamic Sharia law were told on Wednesday to get out of Australia** , as the government targeted radicals in a bid to head off potential terror attacks.

**'IMMIGRANTS, NOT AUSTRALIANS, MUST ADAPT**. **Take It Or Leave It**. I am tired of this nation worrying about whether we are offending some individual or their culture. Since the terrorist attacks on Bali, we have experienced a surge in patriotism by the majority of Australians.**''This culture has been developed over two centuries of struggles, trials and victories by millions of men and women** who have sought freedom'

'We speak mainly ENGLISH, not Spanish, Lebanese, Arabic, Chinese, Japanese, Russian, or any other language. Therefore, **if you wish to become part of our society . Learn the language!'**

'Most Australians believe in God. This is not some Christian, right wing, political push, but a fact, because **Christian men and women, on Christian principles, founded this nation**, and this is clearly documented. It is certainly appropriate to display it on the walls of our schools. If God offends you, then I suggest you consider another part of the world as your new home, because God is part of our

culture.'`We will accept your beliefs, and will not question why. **All we ask is that you accept ours, and live in harmony and peaceful enjoyment with us.'**

**'This is OUR COUNTRY, OUR LAND, and OUR LIFESTYLE**, and we will allow you every opportunity to enjoy all this. But once you are done complaining, whining, and griping about Our Flag, Our Pledge, Our Christian beliefs, or Our Way of Life, I highly encourage you take advantage of one other great Australian freedom,**'THE RIGHT TO LEAVE'**."If you aren't 'happy here then LEAVE. **We didn't force you to come here. You asked to be here. So accept the country YOU accepted**.'

20 වන සියවසේ මුල් භාගය වන විට ඇතිවුණු ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී ගැති වහල් මානසිකත්වයෙන් සිංහලයන් මුදවා ඔවුන්ගේ ඉපැරණි පෞඪ ඉතිහාසය මතක් කර දී නින්දෙන් අවදි කර ඔවුන්ට නිදහස ලබාදීම වෙනුවෙන් පෙරමුණ ගත් අපගේ සිංහල ජාතියේ පියාණන් හැටියට සැළකන

**අනගාරික ධර්මපාලතුමන් වර්ෂ 1931 දී කරන ලද ප්‍රකාශය** ගැන සලකා බලමු.

*''මතක තියාගනිල්ලා කවදා හරි සුද්දො මේ රට දාල යනව. උන් යන්නෙ උන්ගෙ දරුවො වාගේ කලු සුද්දො විසි තිස්දාහක් බෝකළාට පස්සෙ. ඊට පස්සෙ මේ අපේ රට පාලනය කරන්නෙ කලු සුද්දො. උන් සිංහල භාෂාවට, සිරිත් විරිත්වලට වෛර කරනවා. උන් උඹලෑ දරුවන්ට උගන්වයි ජාති ආගම් භාෂා භේදයක් එපා කියල. දෙමළු, මරක්කලයො, හම්බයො, බෝරකාරයො, කොච්චියො එකයි කියල. එහෙම කියල උන් ඉංග්‍රීසියම රජ කරාවි. පන්සල් වටේ පල්ලි කෝවිල් හදාවි. උඹල උඹලා වෙනුවෙන් දියසේන කුමාරය ඉපදෙනකල් බලාගෙන ඉන්නව. ඉපදෙන්න ඉන්න දියසේනලා තිඹිරි ගෙයිම මරාදාන්න මේ කළු සුද්දන්ට පුළුවන් බව මතක තියාගනිල්ලා. අපේ හාමුදුරුවන්ට උන් එදාට ඉනා බේත් දෙනව. ඉන් පස්සෙ උඹලෑ කෙල්ලො කොල්ලන්ට ඇටිකෙහෙල් කාපු රිළව් වාගෙ නියෝ නියෝ ඉන්න සිද්ධ වේවි.''*

***''දෙමාපියන් ඔබට දී ඇත්තේ කඳ බඩ වඩවන ජාන පමණක් නොවේ. මොළයකුත් දී ඇත. එම මොළයෙන් කරුණු හරි හැටි දැනගෙන ඉදිරියේ දී තීරණ ගන්න වේවි.''***

වසර 85කට පමණ පෙර ජාති හිතෛෂී දේශ හිතෛෂී අනගාරික ධර්මපාලතුමා කී දේ එයයි.

ඉහත සඳහන් පරිදි ඇමරිකාව, රුසියාව, ඕස්ට්‍රේලියාව වැනි බලවත් රටවල නායකයන් කරන දේ සහ කිරීමට බලාපොරොත්තු වන දේ සහ අපගේ අනගාරික ධර්මපාලතුමාගේ අදහස් අතර ඉතා කිට්ටු සම්බන්ධයක් ඇත. **රට දියුණු කර රටේ සංස්කෘතියක් සභ්‍යත්වයක් ඇතිකළ අයගේ සංස්කෘතියට හා භාෂාවට එම රටට එන අලුත් පදිංචිකරුවන් ගරු කළ යුතුයි. සැලකිය යුතුයි. ඒවාට අවනත විය යුතුයි. එසේ නැතිනම් ඔවුන් තම තමන්ගේ මුතුන්මිත්තන් ජීවත් වුණු රටවලටම යා යුතුයි. වර්තමානයේ වාසය කරන 10,000 කට කිට්ටු, රටක් අහිමි එවැනි ජනවර්ග ලෝකයේ රටවල් 193 ක ජීවත් වන්නේ එලෙසය.** දෙමළ ජනවර්ගයට මෙරට දී විශේෂයක් ඇයි?

ජපානය ජපනුන්ගේ රට වශයෙන් සලකන්නාක් මෙන් චීනය චීනුන්ගේ රටක් වශයෙන් සලකන්නාක් මෙන් **සිංහලේ දූපත වසර 2500 කට වැඩි කාලයක් තිස්සේ සිංහලයාගේ රට බව ජාත්‍යන්තරව මෙන්ම ජාතිකව පිළිගෙන ඇත.** මෙය අවුරුදු 2500 කට වැඩි ලිඛිත ඉතිහාසය කියාපාන **මහාවංශය** නමැති ග්‍රන්ථයෙන් ද ඔප්පු වී ඇත.

## එසේ නම් එම දූපතෙන් කොටසක් කඩා බටහිර අධිරාජ්‍ය වාදීන් දකුණු ඉන්දියාවෙන් ගෙනවිත් පදිංචි කළ දෙමළ ජන වර්ගයට දිය යුතු ද?


**සිංහල නාදයේ සභාපති,**

**උපදේශක, ඉංජිනේරු වංශරත්න සේනානායක**

***B.Sc. (Ceylon), Textile Engineer (Germany), L.T.I. (U.K), I.W.S.P. Grad. (U.K)***

Tel : Mob / whats app: +94 (0)77-5769538;


2023.02.01